Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයෙහි නිවාස මාතා තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2017**

01. වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිවාස මාතා III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික කාන්තා පක්ෂයෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2017 ඔක්තෝබර් මාසයේ දී කුරුණෑගල නගරයේ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයක දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

03. *වැටුප් ක්‍රමය* :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව මෙම තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය MN-1-2016 අනුව රු. 27,140-10x300-11x350-10x495-10x660-රු. 45,540 වේ. නමුත් 2020.01.01 දක්වා එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

04. *(අ) අධ්‍යාපන සුදුසුකම්.-*

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම,

*සහ*

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක් (01) වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

*(ආ)* වෙනත් සුදුසුකම්.-

I. අයදුම්පත් කැඳවන දිනට වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුල වසර 03 කට නොඅඩු කාලයක් සඳහා ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය. (අයදුම්කරු වයඹ පළාතේ වසර තුනකට වඩා ස්ථිර පදිංචි අයෙකු සමග විවාහ වූ විට කාලත්‍රයාගේ ස්ථිර පදිංචිය සලකා බැලේ.)

II. සෑම අපේක්ෂකයෙකුම තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

III. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් 2017.10.06 දිනට සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතුය.

IV. 2017.10.06 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

05. *සේවා කොන්දේසි* :

I. මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට පත්වීම් ලාභීන් යටත් විය යුතුය.

II. මෙම තනතුරට පත් කරනු ලබන්නන් තුන් වසරක (03) පරිවාස කාලයකට යටත් වේ.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුළත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව/භාෂා පිළිබඳ ප්‍රවීනතාවක් ලබාගත යුතු ය.

IV. වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිවාස මාතා තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව උසස් කිරීම් සිදුකරනු ලැබේ.

V. මෙම තනතුර සඳහා වූ බඳවා ගැනීමේ/උසස් කිරීමේ පරිපාටියේ සඳහන් රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය, වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහය, වයඹ පළාත් සභා කාර්ය පරිපාටික රීති, දෙපාර්තමේන්තු නියෝග හා රජය හා වයඹ පළාත් සභාව විසින් පනවනු ලබන වෙනත් විධි විධානවලට යටත් විය යුතුය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාවෙන් 70% ක් මෙම විභාගයේ ප්‍රතිඵල මත පුරවනු ලැබේ. පහත සඳහන් විභාග විෂය නිර්දේශයේ දැක්වෙන එක් එක් ප්‍රශ්න පත්‍රයට 40%ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අයදුම්කරුවන් ඔවුන්ගේ ලකුණු කුසලතා අනුපිළිවෙල අනුව හා පුරප්පාඩු සංඛ්‍යාව මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

07. ලිඛිත තරඟ විභාගයට අදාල විස්තර පහත පරිදි වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* | *කාලය* | *මුලු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | සාමාන්‍ය දැනීම හා බුද්ධිය විමසීමට අදාලව සැකසුනු බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 | 40 |
| 2. ළමා රැකවරණය හා ළමයින්ගේ කායික මානසික වර්ධනය පිළිබඳ දැනුම | නිවාසගත දරුවන්ගේ භාරය හා ආරක්ෂාව, ළමා මානසික වර්ධනයට අදාල ක්‍රියාකාරකම් පිළිබඳ සාමාන්‍ය දැනුම, ළමා සෞඛ්‍ය හා ළමා උපදේශනය සම්බන්ධ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්න පත්‍රයකි. | පැය 01-1/2 | 100 | 40 |

08. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. රජයේ රැඳවුම් නිවාසයක හෝ භාරගැනීමේ නිවාසයක හෝ සහතික කළ පාසැලක කොන්ත්‍රාත් පදනම මත හෝ සේවා ගිවිසුමක් මත හෝ නිවාස මාතාවක, පාලිකාවක, සහාය පාලිකාවක ලෙස වසරකට නොඅඩු අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br><br>වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ස්වේච්ඡා ළමා නිවාසයක ප්‍රධාන පාලිකාවක, සහාය පාලිකාවක හෝ පාලිකාවක ලෙස අඛණ්ඩව වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | 50 |
| 2. ක්ෂේත්‍රයට අදාලව ලබා ඇති පුහුණු පාඨමාලා :<br><br>රජයේ පිළිගත් හෝ ලියාපදිංචි ආයතනයක ළමා රක්ෂණයට අදාළ මාස 06 ට වැඩි ඩිප්ලෝමා පාඨමාලා හෝ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ මාස 06 කට වැඩි හෙද පුහුණු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම. (ලකුණු 25)<br><br>රජයේ පිළිගත් හෝ ලියාපදිංචි ආයතනයක ළමා රක්ෂණයට අදළ මාස 06 ට නොඅඩු සහතික පත්‍ර පාඨමාලා හෝ පිළිගත් ආයතනයක මාස 06 ට නොඅඩු හෙද පුහුණු සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. (ලකුණු 15)<br><br>(මෙහිදී පිළිගත් ආයතන යනු ජාතික සමාජ සංවර්ධන ආයතනය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයතනයක් හෝ තෘතීක හා වෘත්තීය කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් වේ.) | **40** |

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| *වෙනත් කුසලතා :* <br><br> රජයේ තෘතීක හා වෘත්තීය කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක මාස තුනකට වැඩි පරිගණක පුහුණු පාඨමාලා හෝ මානව සම්පත් කළමනාකරණ පාඨමාලා (එක් පාඨමාලාවකට ලකුණු 05 බැගින් උපරිම පාඨමාලා 02 ක් සඳහා) | 10 |
| එකතුව | **100** |

09. විභාග ගාස්තු වශයෙන් රු: 500/- ක් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන පරිදි තමුන් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබාගන්නා ලෙස ද ව.ප.ස.මු./2 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැළකිය යුතුය. (රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

10. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල :*

10.1 මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.10.06 වැනි දින හෝ එදිනට පෙර "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිවාස මාතා තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017" යනුවෙන් සඳහන් කළ යුතුය.

10.2 දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

10.3 නියමිත ආදර්ශ ආකෘතියට අනකුල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, නිසි ලෙස තොරතුරු ඇතුළත් නොකළ, අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරා ගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

11. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය : 2017.10.06

12. මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත්කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා මෙම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදළ ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත්කළ යුතුය. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදල සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

13. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :*

අපේක්ෂකයින් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාව පහත සඳහන් ලියවිලිවලින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතුය.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත්කරන ලද ජාතික හැඳුනුම්පත.

2. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*සටහන :* විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

14. කිසියම් අපේක්ෂකයෙකුට සිය ප්‍රවේශ පත්‍රය විභාගයට යටත් පිරිසෙයින් දින 07 කට පෙර නොලැබුනොත් ඒ බව වහාම "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට දන්විය යුතුයි. එසේ දැනුම් දීමේ දී පහත විස්තර ඉදිරිපත්කළ යුතුය.

(අ) විභාගයේ නම :..........................................................................................
(ආ) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :..........................................................................................
(ඇ) ලිපිනය :..........................................................................................
(ඈ) අයදුම්පත්‍රය යොමු කළ ලිපිනය, ලියාපදිංචි තැපෑලේ අංකය හා දිනය :............................................................

15. යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම් ලැබීමෙන් පසු හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත්කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑ කමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

16. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

17. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරාගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණය ද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

පද්මිණි කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2017 අගෝස්තු මස 29 වැනි දින,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (වයඹ),
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයෙහි නිවාස මාතා තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017

විභාග අංකය : [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

01. 1.1 මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................................

1.2 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................................

..........................................................................................

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................

..........................................................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

02. 2.1 ස්ථිර ලිපිනය :...................................................................................................................................................

2.2 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :...................................................................................................................

2.3 දුරකථන අංකය : පෞද්ගලික :............................................. රාජකාරී :.....................................................

03. උපන් දිනය : වර්ෂය :......................... මාසය :.................... දිනය :.....................

04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2017.10.06 දිනට වයස :

අවුරුදු :......................... මාස :......................... දින :.........................

05. 2017.10.06 දිනට වයඹ පළාතේ ස්ථිර පදිංචිය :

අවුරුදු :......................... මාස :......................... දින :.........................

06. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් : (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 4 (අ) හි සඳහන් පරිදි,

අ. පො. ස (සා.පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා විභාග අංකය :

වර්ෂය :..................... විභාග අංකය :.........................................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ. පො. ස (උ.පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා විභාග අංකය :

වර්ෂය :..................... විභාග අංකය :.........................................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |

07. නිවේදනයේ 08 ඡේදයේ සඳහන් පරිදි,

පළපුරුද්ද :..............................................................................................................................................

ක්ෂේත්‍රයට අදාලව ලබා ඇති පුහුණු පාඨමාලා :..............................................................................................

වෙනත් කුසලතා :........................................................................................................................................

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :..............................................................
දිනය :..........................................................................
ලදුපත් ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :..............................................................................

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |
|---|

09. *අයදුම්කරුගේ සහතිකය :*

............................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ............................................. හා ................................ වැනි දින දරන ලදු පත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයකට මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද, ප්‍රකාශ කරමි.

..........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.........................................

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................................... මිය/මෙනවිය, මා පෞද්ගලිකව හඳුනන බවත්, ඇය ......................... දින මා ඉදිරිපිටදී ඇය ගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන අයගේ නම :..........................................
අත්සන :..........................................
තනතුර හා නිල මුද්‍රාව :..........................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සමාදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 2,40,360/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන, ස්ථිර තනතුරක් දරණ රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.)

**රජයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

(අනවශ්‍ය වචන කපා හරින්න.)

.................................................. මිය/මෙනවිය දැනට ................................ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ....................... ........... වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත්, ඇය රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා ඇති/නැති බවත් සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය තෝරා ගනු ලැබුවහොත් ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකිය.

.........................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
නිල මුද්‍රාව තබන්න.

දිනය :..........................................